දකුණු පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු චක්‍රලේඛ 01/2025

මගේ අංකය : PD/S/DAPH/AO/EST-43-3
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
නූපෙ, මාතර

2025.12.

අතිරේක පළාත් අධ්‍යක්ෂ/විෂය විශේෂඥ
නියෝජ්‍ය අධ්‍යක්ෂ - පළාත් කාර්යාලය/ගාල්ල/මාතර/හම්බන්තොට,
සියලු පශු වෛද්‍ය නිලධාරීන් / සත්ත්ව පාලන නිලධාරීන්,
ස්ථාන භාර නිලධාරීන් - සත්ත්ව පාලන පුහුණු මධ්‍යස්ථානය,
ස්ථාන භාර නිලධාරී - කැකණඳුර ගොවිපොළ.

<u>දකුණු පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අයත් කාර්යාල වල නිලධාරීන්ගේ රාජකාරි වේලාවන් සංශෝධනය කිරීම.</u>

උක්ත කරුණට අදාළව පේරාදෙණිය සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ 2024.09.20 දිනැති 09/2024 හා 2025.01.01 දිනැති 09/2024(1) චක්‍රලේඛ සංශෝධන සහිතව දකුණු පළාතට අදාළ කර ගැනීම සඳහා මෙම පළාත් චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

02. උක්ත කරුණ සම්බන්ධයෙන් 2025.01.01 දින නිකුත් කරන ලද සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු චක්‍රලේඛ 09/2024 (i) හි අංක 2 හා 3 කරුණු අනුව,

I. රාජ්‍ය නිලධාරීන්ගේ කාර්යාල වේලාව සම්බන්ධයෙන් නිකුත් කර ඇති 2006.05.30 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 09/2006 ට අනුව රජයේ සේවාවන්ට නියුතු කණිෂ්ට සේවකයන් හැර අනෙකුත් සියළුම සේවකයන්ගේ කාර්යාල වේලාව (දිවා භෝජනය සඳහා විනාඩි 30ක කාලය සමඟ) පෙ.ව. 8.30 සිට ප.ව. 4.15 දක්වා වේ.

II. ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 1:10:2 වගන්තියට අනුව සෙනසුරාදා දින සේවය කරනු ලබන නිලධාරීන් සඳහා , සතියට දින පහමාරක් (5 ½) සේවය කළ යුතු යැයි නියම කර ඇති රජයේ නිලධරයන් ලෙස සඳහන්ව ඇත.

ඉහත කරුණු සැලකිල්ලට ගනිමින් ,

03. පශු වෛද්‍ය කාර්යාලවල පශු වෛද්‍ය නිලධාරීන්ගේ රාජකාරි වේලාව පහත පරිදි අදාළ කර ගත යුතු බව කාරුණිකව දන්වමි.

| **පශු වෛද්‍ය කාර්යාලවල පශු වෛද්‍ය නිලධාරීන්** | **පැමිණීම** | **පිටවීම** |
|---|---|---|
| සතියේ දිනවල | පෙ.ව. 8.30 | ප.ව. 3.30 |
| සෙනසුරාදා දිනවල | පෙ.ව. 8.30 | ප.ව. 12.15 |

04. පළාත් අධ්‍යක්ෂ කාර්යාලය, නියෝජ්‍ය අධ්‍යක්ෂ කාර්යාල හා පශු වෛද්‍ය කාර්යාල වල අනෙකුත් නිලධාරීන් හා සේවකයන් සඳහා පහත පරිදි රාජකාරි වේලාවන් අදාළ වේ.

| පළාත් අධ්‍යක්ෂ කාර්යාලය / නියෝජ්‍ය අධ්‍යක්ෂ කාර්යාල | පැමිණීම | පිටවීම |
|---|---|---|
| පශු වෛද්‍යවරු ඇතුළත්ව සියලු නිලධාරීන් | පෙ.ව. 8.30 | ප.ව. 4.15 |
| කණිෂ්ඨ සේවකයින් | පෙ.ව. 8.00 | ප.ව. 4.45 |
| මුරකරු - දිවා | පෙ.ව. 6.00 | ප.ව. 6.00 |
| මුරකරු - රාත්‍රී | ප.ව. 6.00 | පෙ.ව. 6.00 |

| පශු වෛද්‍ය කාර්යාල - සතියේ දින | පැමිණීම | පිටවීම |
|---|---|---|
| සංවර්ධන නිලධාරීන්, සත්ත්ව සංවර්ධන උපදේශකවරුන් ඇතුළු නිලධාරීන් | පෙ.ව. 8.30 | ප.ව. 3.30 |
| කණිෂ්ඨ සේවකයින් | පෙ.ව. 8.00 | ප.ව. 4.00 |

I. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 05/2015 අනුව පශු වෛද්‍ය කාර්යාල වල කණිෂ්ඨ සේවකයින් සඳහා සතියේ දිනවල ප.ව. 3.45 න් පසු රාජකාරි නොපවතී නම් එම නිලධරයන්ට ප.ව. 3.45 ට කාර්යාලයෙන් බැහැරව යාමට ඉඩ දීමට ආයතන ප්‍රධානියාට හැකියාව ඇත.

| පශු වෛද්‍ය කාර්යාල - සෙනසුරාදා | පැමිණීම | පිටවීම |
|---|---|---|
| සංවර්ධන නිලධාරීන්, සත්ත්ව සංවර්ධන උපදේශකවරුන් ඇතුළු නිලධාරීන් | පෙ.ව. 8.30 | ප.ව. 12.15 |
| කණිෂ්ඨ සේවකයින් | පෙ.ව. 8.00 | ප.ව. 12.45 |

කේ.එල්.කේ.එස්. පෙරේරා
පළාත් අධ්‍යක්ෂ (දකුණ)

පිටපත් :

01. ප්‍රධාන ලේකම් - දකුණු පළාත
02. ලේකම් - ධීවර හා සත්ත්ව නිෂ්පාදන අමාත්‍යාංශය, දකුණු පළාත

77

දකුණු පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු චක්‍රලේඛ 02/2025

මගේ අංකය : PD/S/DAPH/AO/EST-43-3
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
නූපෙ, මාතර

2025.12.

අතිරේක පළාත් අධ්‍යක්ෂ/විෂය විශේෂඥ
නියෝජ්‍ය අධ්‍යක්ෂ - පළාත් කාර්යාලය/ගාල්ල/මාතර/හම්බන්තොට,
සියලු පශු වෛද්‍ය නිලධාරීන් / සත්ත්ව පාලන නිලධාරීන්,
ස්ථාන භාර නිලධාරීන් - සත්ත්ව පාලන පුහුණු මධ්‍යස්ථානය,
ස්ථාන භාර නිලධාරී - කැකණදුර ගොවිපොළ.

**<u>රජයේ පශු වෛද්‍ය නිලධාරීන් විසින් සතුන්ට ප්‍රතිකාර කිරීම.</u>**

උක්ත කරුණට අදාළව පේරාදෙණිය සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජෙනරාල්ගේ 2024/09/20 දිනැති 09/2024 චක්‍රලේඛය සංශෝධන සහිතව දකුණු පළාතට අදාළ කර ගැනීම සඳහා මෙම පළාත් චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

**01. රාජකාරි වේලාවන් තුළ ප්‍රතිකාර කිරීම**

රජයේ පශු වෛද්‍ය නිලධාරීන් විසින් රජයේ පශු වෛද්‍ය කාර්යාල හෝ පශු රෝහල්වල ඩිස්පැන්සරියේ හෝ ක්ෂේත්‍රයේ සේවා සැපයීමේදී සත්ත්ව රෝග සඳහා ප්‍රතිකාර කිරීම, රෝග නිවාරණය, රෝග වැළැක්වීම, ශල්‍යකර්ම සිදු කිරීම, මරණ පරීක්ෂණ සිදු කිරීම, රෝග විනිශ්චය සඳහා රසායනාගාර පරීක්ෂණ වාර්තා ලබා ගැනීම වැනි කරුණු සඳහා අය කළ යුතු සේවා ගාස්තු පහත සඳහන් වේ.

**2.1 කෘෂිකාර්මික සතුන් සඳහා**

රජයේ පශු වෛද්‍ය නිලධාරීන් විසින් කෘෂිකාර්මික සතුන් සඳහා රාජකාරි වේලාවන් තුළ කාර්යාලයේදී හෝ ජංගම සායනයේ දී හෝ ක්ෂේත්‍රයේදී ප්‍රතිකාර කිරීමේදී, සත්ත්ව රෝග පනතේ ( 1992 අංක 59 දරණ සත්ව රෝග පනත) උපලේඛන ගත රෝග නිවාරණ එන්නත් ලබා දීමේදී, වෘත්තිමය හෝ උපදේශක ගාස්තු වශයෙන් කිසිදු සේවා ගාස්තු අය කිරීමක් සිදු නොකළ යුතුයි. එහෙත් මරණ පරීක්ෂණ ගාස්තු හෝ රසායනාගාර ගාස්තු අය කළ හැකිය.

**2.2 කෘෂිකාර්මික නොවන සතුන් සඳහා**

රජයේ පශු වෛද්‍ය නිලධාරීන් විසින් සුරතල් සතුන්ට ප්‍රතිකාර කරන වේලාව පහත පරිදි වේ.

සතියේ දින - පෙ.ව. 8.30 - පෙ.ව.10.30 දක්වා
සෙනසුරාදා දින - පෙ.ව. 8.30 - ප.ව. 12.15 දක්වා

රජයේ පශු වෛද්‍ය නිලධාරියෙක් විසින් පශු වෛද්‍ය කාර්යාලයේදී හෝ පශු රෝහලක දී රාජකාරි වේලාවන් තුළ කෘෂිකාර්මික නොවන සතුන්ගේ රෝග පරීක්ෂාව, නිර්ණය, නිවාරණය සහ ප්‍රතිකාර කිරීම වෙනුවෙන් පහත සඳහන් පරිදි සේවා ගාස්තු අය කළ යුතුය.

I. උපදේශන ගාස්තු අය කිරීම (සතෙකු සඳහා)

| | | |
|---|---|---|
| II. | නොමුහුන් සුනඛයින් / බළලුන් | රු.300.00 |
| III. | දෙමුහුන් සුනඛයින් / බළලුන් | රු.150.00 |
| IV. | සුරතලයට ඇති කරන පක්ෂීන් | රු.300.00 |
| V. | අශ්වයින් සහ පෝනීන් | රු.1000.00 |
| VI. | අලි ඇතුන් | රු.2000.00 |
| VII. | අනෙකුත් කෘෂිකාර්මික නොවන සතුන් | රු.200.00 |
| VIII. | සුරතල් මත්ස්‍යයින් | රු.200.00 |
| IX. | සුරතල් සතුන් සඳහා සෞඛ්‍ය සහතික නිකුත් කිරීම | රු.1000.00 |
| X. | බෙහෙත් වට්ටෝරුවක් පමණක් නිකුත් කිරීම | රු.100.00 |

ii. නිවාරණ එන්නත් ලබා දීමේදී සේවා ගාස්තුව - රු.100.00

iii. ශල්‍යකර්ම සේවා ගාස්තුව (සතෙකුට)

| | | |
|---|---|---|
| a. | Surgical Sterilization / Castration - Dogs | රු.2000.00 |
| b. | Surgical Sterilization / Castration - Cats | රු.1500.00 |
| c. | Cosmetic Surgery | රු.700.00 |
| d. | Non Invasive surgery without anesthesia | රු.700.00 |
| e. | Invasive surgeries under anesthesia | රු.2000.00 |
| f. | Wound dressing | රු.500.00 |
| g. | Removal of sutures, pops, Dressing W/O anesthesia | රු.300.00 |
| h. | Collection of tissue sample | රු.200.00 |

**2.3 රාජකාරි ඉටු කිරීමේදී මරණ පරීක්ෂණ සඳහා ගාස්තු අය කිරීම (සතෙකුට)**

| | සත්ත්ව වර්ගය | ඒකක ගාස්තුව |
|---|---|---|
| I. | Poultry | රු.100.00 |
| II. | Small Ruminants | රු.500.00 |
| III. | Swine | රු.500.00 |
| IV. | Rabbit | රු.500.00 |
| V. | Large Ruminant | රු.1000.00 |
| VI. | Nonagricultural animals | රු.500.00 |

**2.4 රසායනාගාර ගාස්තු අය කිරීම**

ඒ සඳහා දෙපාර්තමේන්තු අනුමත මිල ගණන් භාවිතා කළ යුතුයි. (2023.03.23 දිනැති දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 03/2023 – DAPH/AD/16/02/06)

**2.5 නේවාසික ගාස්තු අය කිරීම**

1. රජයේ පශු වෛද්‍ය නිලධාරීන් විසින් ඉටුකරන ඕනෑම ප්‍රතිකාර කිරීමකදී කෘෂිකාර්මික නොවන හෝ සුරතල් සතුන් සඳහා ඖෂධ, එන්නත්, රෝග විනිශ්චය යෙදවුම් සහ වෙනත් යෙදවුම් සඳහා නියම කර ඇති මිල ගණන් හා ගාස්තු පිළිබඳ නිර්දේශ ලබා ගැනීමට අමාත්‍යාංශ ලේකම් විසින් නම් කරන ලද නිලධාරීන් ඇතුළත් කමිටුවක් පත් කළ යුතුය. එම කමිටුව මාස 03 කට වරක් රැස්විය යුතු අතර එම කමිටුව මඟින් නිර්දේශිත මිල ගණන් පමණක් සේවා දායකයාගෙන් අය කරගත යුතුයි. එහිදී කිසියම් ගාස්තු සංශෝධනයක් සිදු වන්නේ නම් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගෙන දකුණු පළාත තුළ ක්‍රියාත්මක කළ යුතුය.

2. කෘෂිකාර්මික සතුන් සඳහා යොදාගන්නා ඖෂධ, එන්නත්, රෝග විනිශ්චය යෙදවුම් සහ වෙනත් යෙදවුම් සඳහා සේවාලාභියාගෙන් මුදල් අය කරනු නොලබනු අතර එම ප්‍රතිකාර සම්පූර්ණයෙන්ම නොමිලේ සිදු කෙරේ.

3. මෙම සේවා ගාස්තුවලට අමතරව රජයේ පශු වෛද්‍ය නිලධාරීන් විසින් ඉටු කරන ඕනෑම ප්‍රතිකාර කිරීමකදී කෘෂිකාර්මික නොවන හෝ සුරතල් සතුන් සඳහා යොදාගන්නා ඖෂධ ,එන්නත් , රෝග විනිශ්චය යෙදවුම් සහ වෙනත් යෙදවුම් සඳහා නියම කර ඇති මිල ගණන් පමණක් සේවාලාභියාගෙන් අය කළ යුතුය.

4. රජයේ පශු වෛද්‍ය නිලධාරියෙකු විසින් රාජකාරි වේලාවන් තුළ ඉටු කරනු ලබන ඉහත ප්‍රතිකාර ක්‍රම සම්බන්ධයෙන් අදාළ ගාස්තු අය කර ඒ සඳහා පළාත් සභාව විසින් ලබා දී ඇති මුදල් භාර ගැනීමේ කුවිතාන්සියක් /රිසිට් පතක් අනිවාර්යෙන්ම නිකුත් කළ යුතුය. එම මුදල නිශ්චිත වූ රජයේ ආදායම් ගිණුමට බැර කළ යුතුය.

5. රාජකාරි වේලාවෙන් පරිබාහිර, සතුන්ට ප්‍රතිකාර කිරීම සඳහා පුද්ගලික සේවයේ යෙදීම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ 1 වැනි කාණ්ඩයෙහි XXX වැනි පරිච්ඡේදයෙහි 1.5 වගන්තිය අදාළ කර ගත යුතු වේ.

6. රාජකාරි වේලාවෙන් පරිබාහිරව කෘෂිකාර්මික නොවන හෝ සුරතල් සතුන්ට ප්‍රතිකාර කිරීමේදී පශු වෛද්‍ය නිලධාරියෙකු විසින් කාර්යාල පරිශ්‍රය හෝ රජයේ කිසිදු දේපළක් හෝ ඖෂධ හෝ උපකරණ හෝ භාවිතයට ගැනීම නොකළ යුතුය.

**අර්ථ දැක්වීම :**

කෘෂිකාර්මික සතුන් - වාණිජමය පරමාර්ථයෙන් නිවසේ හෝ ගොවිපළවල ඇති කරන සතුන්
උදා : ගවයින්, එළුවන්, සූකර, කුකුළන්, ජලජ ජීවීන් වැනි

සුරතල් සතුන් - මිනිසා සමඟ මිත්‍රශීලී වාසය සඳහා ඇති කරන සතුන්
උදා : බල්ලා , බළලා , පක්ෂීන් , ජලජ ජීවීන් වැනි

කේ.එල්.කේ.එස්. පෙරේරා
පළාත් අධ්‍යක්ෂ (දකුණ)

පිටපත් :

01. ප්‍රධාන ලේකම් - දකුණු පළාත
02. ලේකම් - ධීවර හා සත්ත්ව නිෂ්පාදන අමාත්‍යාංශය, දකුණු පළාත